# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,203 — 1936ක්වූ පෙබරවාරි මස 21 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඞගනීති.

1920යේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණත.

අනුරාධපුර ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය්‍ය සභාව විසින් 1920යේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණතේ 25 (1)වෙනි වගන්තිය යටතේ සම්පාදිතව අධ්‍යාපන සභාව විසින් මැනවැයි පිළිගන්නාලදින් ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් (එම) ආඥාපණතේ 25 (5) වෙනි වගන්තියෙන් හා 1931යේ (ලංකා රාජ්‍යසභා) රාජසභාවේ නියෝගයේ 93වෙනි වගන්තියෙන් උන්වහන්සේ කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිරකරනලද උපනීති.

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
අධ්‍යාපන අමාත්‍යතැන.

වම් 1936ක්වූ පෙබ්‍රවාරි මස 12වෙනි දින කොළඹ අධ්‍යාපන අමාත්‍යතුමාගේ කාර්‍ය්‍යාලයේදීය.

### උපනීති.

1. (1) යම් රැස්වීමක් පැවැත්වීමට නියමකර තිබෙන දිනට සතියකට අඩු නැති කාලයකට කලින් ප්‍රධානතුමා විසින් ඒ රැස්වීම පැවැත්වීමට තරම් සෑහෙන කටයුතු නැති බැවින් එය පවත්වන්නේ නැතැයි කියා ලියවිල්ලකින් දැනුම් දුනහොත් හෝ ඒ දැන්වීමෙහි නියමකර තිබෙන වෙනයම් දිනක එය පවත්වන්නේයයි කියා දැනුම් දුනහොත් මිස නැත්නම් කාර්‍ය්‍ය සභාවේ සාමාන්‍ය රැස්වීම් පෙබරවාරි, අප්‍රේල්, ජූනි, අගෝස්තු, ඔක්තෝබර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේ තුන්වෙනි වරට යෙදෙන සෙනසුරාදා දිනවල පැවැත්විය යුතුයි.

(2) අදහස්කරන කටයුතුවල ස්වභාවය දක්වා තමා විසින් රැස්වීම පැවැත්වීමට නියමකරගත් දිනට සතියකට කලින් සාමාජිකයන්හට ලියවිල්ලකින් දැන්වීමක් භාරකිරීමෙන් විශෙෂ රැස්වීමක් පැවැත්වීමට ප්‍රධානතුමාට පුළුවන.

(3) ප්‍රධානතුමා විසින් එක් එක් රැස්වීමෙහි තොරතුරු පිළිවෙළින් වාර්තා පොතක සටහන්කොට සෑම රැස්වීමකම තොරතුරුවල පිටපතක් ඒ රැස්වීමට පසු හැකිතරම් ඉක්මනින් එක් එක් සාමාජිකයා වෙත යවන්ට සැලැස්විය යුතුයි.

2. (1) අනුරාධපුර නගරබද දිස්ත්‍රික් කාර්‍ය්‍ය සභාවේ බලය පවත්නා සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය ඇතුළු අනුරාධපුර මුළු අධ්‍යාපන දිස්ත්‍රික්කය, අධ්‍යාපන මණ්ඩලය විසින් පිළිගත් පාඨශාලා මගින් මූලික අධ්‍යාපනයක් ලබාදීම පිණිස හොඳින් විධිවිධාන සලස්වා ඇති ප්‍රදෙශයක් හැටියට මෙයින් ප්‍රකාශකරනු ලැබේ.

(2) මේ උපනීතිවල "පාඨශාලව" යනුවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් දැනටමත් පිළිගෙන තිබෙන්නාවූ හෝ මින් පසු පිළිගන්නාවූ එකී දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන පාඨශාලාවලින් කවර එකක් වුවත් අදහස්කරනු ලැබේ.

3. (a) එකී දිස්ත්‍රික්කය තුළ පදිංචි වයස අවුරුදු 6කට අඩුනුවූ හා 14කට වැඩිනුවූ සෑම පිරිමි ළමයාගේ මව හෝ පියාද,
(b) එකී දිස්ත්‍රික්කය තුළ පදිංචි වයස අවුරුදු 6කට අඩුනුවූ හා 12කට වැඩිනුවූ සෑම ගැහැනු ළමයාගේ මව හෝ පියාද,

ඒ පිරිමි ළමයාගේ හෝ ගැහැනු ළමයාගේ ඉගෙනීම සඳහා තමා විසින් වෙන සෑහෙන විධිවිධාන සලස්වා හෝ අසරණකම හෝ අසනීපයක නිසා හෝ වෙන යම් සැලකියයුතු කරුණක් නිසා ඒ පිරිමි ළමයා හෝ ගැහැනු ළමයා කාර්‍ය්‍ය සභාවේ ප්‍රධානතුමා විසින් පාඨශාලාවට පැමිණීමෙන් නිදහස්කර හෝ තිබේනම් මිස නැත්නම් ඒ පිරිමි ළමයාට හෝ ගැහැනු ළමයාට පාඨශාලාවට පැමිණීමට සැලැස්විය යුතුයි.

එහෙත්—

(a) අවුරුදු 10යෙන් ඉහළ මුස්ලිම් හෝ දෙමළ ගැහැනු ළමයින්ට, හෝ
(b) ව්‍යවස්ථා පොතේ 5වෙනි ප්‍රමාණයට නියමිතවූ විභාගයෙන් කියවීම, ලිවීම, (අංක) ගණිතය යන මේ කරුණුවලින් සමත්වූ බවට අධ්‍යාපන මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක මුලාදැනියෙකුගෙන් සහතික පත්‍රයක් දරන්නාවූද ප්‍රධානතුමා මැනවැයි පිළිගනු ලබන විධියේ ප්‍රයෝජනවත් කටයුත්තක යෙදී සිටින්නාවූද අවුරුදු 14රෙන් පහළ නැමතිම පිරිමි ළමයකුට හෝ අවුරුදු 12යකන් පහළ නැමතිම ගැහැනු ළමයකුට, හෝ
(c) තම ගෙදර හෝ පදිංචි ස්ථානය හැතැප්මකට වැඩිවූ අවුරුදු 8ටෙන් පහළ නැමතිම පිරිමි ළමයකුට හෝ ගැහැනු ළමයකුට හෝ නැමතිම පාඨශාලාවක සිට ඉතාම කිට්ටු පාරෙන් තම ගෙදරට හෝ පදිංචි ස්ථානයට හැතැප්ම 2කට වැඩිවූ අවුරුදු 8ටෙන් ඉහළ නැමතිම පිරිමි ළමයකුට

එසේ පාඨශාලාවට පැමිණීමට බල නොකළ යුතුයි.

4. මේ උපනීති සම්බන්ධයෙන් කවර ළමයකුගේ වුවත් දිනපතා පාඨශාලාවට පැමිණ සිටීමේ කාලය ඒ සමාන වයස්වල ළමයින්ගේ ඉගෙනීම සඳහා පාඨශාලාව දිනපතා පවත්වන සම්පූර්ණ කාලය වියයුතුයි; එහෙත් ආඥාපණතේ 15 (2) වෙනි වගන්තියේ ප්‍රකාර ආගම ඉගැන්වීම කෙරෙන කාලය තුළ කවර ළමයකුට වුවත් නොපැමිණ සිටීමට අවසර දියහැකියි.

5. මේ උපනීතිවල විධිවිධාන නොපිළිපදින්නාවූ කවර මවකු හෝ පියකු වුවත් රුපියල් 5කට වැඩිනොවන්නාවූ දඩයක්ද ඒ වරද ඉදිරියටත් කරගෙන යන්නේ නම් එසේ කරන දෙවෙනි දවසට හා ඉන්පසු එක් එක් දවසට රුපියල් 1කට වැඩිනොවන්නාවූ දඩයක්ද ගැසියහැකි වරදක් කළානම් වේ.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,241 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ පෙබ්‍රවාරි මස 21වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩම කැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 31වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

එච්. සී. කොක්ස්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරනු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

### උප ලේඛනය.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත් පත්තුවේ මැද්දෙකැටියකෝරළේ ගොඩගන්වෙල යන ගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම්:—

උතුරට : මහගම යන ගම ගම්ඉමද.

නැගෙණහිරට : මහගම යන ගම ගම්ඉමද, මහගම යන ගම ගම්ඉමද (ඇල).

දකුණට : හංගිලිපොල යන ගම ගම්ඉම සහ දකුණු යටිකහ කෝරළේ මායිමද.

බස්නාහිරට : මහගම යන ගම ගම්ඉමද.

ලංකාමැනීමේ මුල් සිතියම් නො. 2,581.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|
| 9 | හොරවිඇල සහ වාන්ඇල (වාරිමායිමයේ ඇලවල්). | .. | 0 | 1 | 8 |
| 16 | කරත්තපාර සහ ඉතුරුකර තිබෙන බිම | .. | 0 | 1 | 35 |
| 19 | බැද්දෙවැව (වැව සහ කන්ඩිය) | .. | 5 | 3 | 8 |
| 22 | මැවගාවහේන සහ ගල්වෙලසිටියහේන (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) | .. | 1 | 0 | 9 |
| 24 | කරත්තපාර | .. | 0 | 0 | 21 |
| | | | 7 | 3 | 1 |

කුරුණෑගල නි. නි. 30—1936.

---

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම් නො. 1,242 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ පෙබ්‍රවාරි මස 21වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන්ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 31වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

එච්. සී. කොක්ස්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම් කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරනු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

### උපලේඛනය.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත් පත්තුවේ මැද්දෙකැටියකෝරළේ ඇල්ලේහේන යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම්:—

උතුරට සහ නැගෙණහිරට : ලංකරන්ගෙදර යන ගම ගම්ඉමද.

දකුණට : පොල්ගහකොටුව යන ගම ගම්ඉමද, පොල්ගහකොටුව යන ගම ගම්ඉමද (මාරකයාවැවේඇල), පොල්ගහකොටුවව යන ගම ගම්ඉමද, ලංකරන්ගෙදර යන ගම ගම්ඉමද (කඩවලේඇල).

බස්නාහිරට : ලංකරන්ගෙදර යන ගම ගම්ඉමද (කඩවලේ ඇල), ලංකරන්ගෙදර යන ගම ගම්ඉමද.

ලංකාමැනීමේ මුල් සිතියම් නො. 2,593.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|
| 2 | ඇල්ලේහේනවැව (වැව සහ කන්ඩිය) | .. | 0 | 3 | 17 |
| 3 | පිච්චෙවත්තෙගල්ගොඩහේන | .. | 0 | 1 | 31 |
| 8 | ඉබ්බන්වලේකැලේ | .. | 0 | 0 | 36 |
| | | | 1 | 2 | 4 |

කුරුණෑගල නි. නි. 31—1936.

---

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීමේ නො. 1,243 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 21වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 31වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

එච්. සී. කොක්ස්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම් කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

### උප ලේඛනය.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත් පත්තුවේ මැද්දෙකැටියෙකෝරළේ කුඹුකකොටුව යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම් :—

උතුරට : බැමිණිගල්ල යන ගම ගම්ඉමද.

නැගෙණහිරට: බැමිණිගල්ල යන ගම යෙඉමද, සයාපොල යන ගම ගම්ඉමද, (උඩගෙයාරකට යන පාරෙන් කොටසක්), සියාපොල යන ගම ගම්ඉමද (සියාපොලඇලෙන් කොටසක්), සියාපොල යන ගම ගම්ඉමද, බැමිණිගල්ල යන ගම ගම්ඉමද.

දකුණට: උනලිය යන ගම ගම්ඉමද.

බස්නාහිරට: දකුණු යටිකහකෝරළේ මායිමද.

ලංකාමැනිමේ මුල් සිතියමේ නො. 2,446.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 3 | ගම්සහාපාර සහ ඉතුරුකර තිබෙන බිම් .. | 1 | 2 | 3 |
| 3A | ඉහලආවාරියාපුරණහේනෙවත්ත .. | 0 | 0 | 1 |
| 3B | ලෙල්ලගහමුලවත්ත .. .. | 0 | 0 | 7 |
| 3C | දන්ගහමුලවත්ත .. .. | 0 | 0 | 6 |
| 3D | එම .. .. | 0 | 0 | 11 |
| 3E | එම .. .. | 0 | 0 | 1 |
| 3F | මීගහමුලවත්ත .. .. | 0 | 0 | 11 |
| 5 | කඹලියාවත්ත (ගම්සහාපාරදියේ ඉතුරුකර තිබෙන බිම්) .. .. | 0 | 0 | 13 |
| 9 | සියාපොලඇල .. .. | 0 | 1 | 5 |
| 12 | ගම්සහාපාර සහ ඉතුරුකර තිබෙන බිම් (හරි කොටසක්) .. | 0 | 0 | 23 |
| 13 | ගම්සහාපාර සහ ඉතුරුකර තිබෙන බිම් .. | 0 | 1 | 27 |
| 22 | අඩිපාර .. .. | 0 | 0 | 33 |
| 26 | සියාපොලඇල (හරිකොටසක්) .. | 0 | 0 | 38 |
| 30 | ගම්සහාපාර .. .. | 0 | 2 | 9 |
| 31A | කඩහේනෙවත්ත (පාරට ඉතුරුකර තිබෙන බිම්) .. .. | 0 | 0 | 4 |
| 33 | සියාපොලඇල .. .. | 0 | 1 | 26 |
| 34A | දන්ගොල්ලවැව (වැව සහ කන්ඩිය) .. | 0 | 0 | 14 |
| 34D | කන්ඩියෙන් කොටසක් .. .. | 0 | 0 | 3 |
| | | 4 | 0 | 35 |

කුරුණෑගල නි. නි. 32—1936.

---

1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,244 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1936ක්වූ පෙබරවාරි මස 21වෙනිදින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1936ක්වූ පෙබරවාරි මස 8වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

එච්. සී. කොක්ස්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුලත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

උපලේඛනය.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදි හත්පත්තුවේ වල්ගම්පත්තුකෝරළේ පනාදර යන ගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම්:—

1වෙනි කොටස.

උතුරට: නොම්මර 225,684රේ පිඹුරුකඩදාසියේ ඉඩම සහ කොලොන්ගහමුලවත්ත යන නොම්මර 7තේ බිම් කට්ටියේ මායිමද.

නැගෙණහිරට: කොලොන්ගහමුලවත්ත යන නොම්මර 7තේ බිම්කට්ටියේ සහ ඇලගාවවත්ත යන නොම්මර 5තේ බිම්කට්ටියේ මායිමද.

දකුණට: හන්දියවත්ත යන නොම්මර 9වේ බිම්කට්ටිය සහ කොන්ම්පියාන යන ගම ගම්ඉමද.

බස්නාහිරට: නොම්මර 225,684රේ පිඹුරු කඩදාසියේ ඉඩමද.

ලංකාමැනිමේ මුල් සිතියමේ නො. 714.
(නොම්මර 3තේ මුල් පිටපත.)

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 8 | ඉයගලකටුවහේන .. .. | 22 | 0 | 3 |

2වෙනි කොටස.

උතුරට: සී. කිරිබන්ඩා විසින් අයිතිවාසිකම්කියන අළුත්වත්තද.

නැගෙණහිරට: ගම්සහාපාරද.

දකුණට: පණගමුවේ සිට කොස්වත්තට යන ගම්සහාපාරද, කොන්ම්පියාන යන ගම ගම්ඉමද (ගම්සහාපාරෙන් කොටසක්).

බස්නාහිරට: කොන්ම්පියාන යන ගම ගම්ඉමද, ඉයගල කටුවහේන යන නොම්මර 8වේ බිම්කට්ටියේ සහ ඇලගාවවත්ත යන නොම්මර 5තේ බිම්කට්ටියේ මායිමද.

ලංකාමැනිමේ මුල් සිතියමේ නො. 714.
(නොම්මර 3තේ මුල් පිටපත.)

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 9 | හන්දියවත්ත (ගම්සහාපාරට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 25 |

3වෙනි කොටස.

උතුරට: නොම්මර 714රේ ලංකාමැනීමේ මුල් සිතියමේ නොම්මර 2තේ මුල් පිටපතේ වාබොඩකුඹුර යන නොම්මර 4රේ බිම්කට්ටියේ මායිමද.

නැගෙණහිරට: නොම්මර 362,516රේ පිඹුරුකඩදාසියේ ඉඩමද, නොම්මර 714රේ ලංකාමැනීමේ මුල් සිතියමේ නොම්මර 1තේ මුල් පිටපතේ වවිපිටිය යන නොම්මර 2තේ බිම්කට්ටියේ මායිමද, පණගමුවේ සිට කොස්වත්තට යන ගම්සහාපාරද.

දකුණට: පණගමුවේ සිට කොස්වත්තට යන ගම්සහාපාරද.

බස්නාහිරට: සිව්වනසිංදෙ විසින් අයිතිවාසිකම්කියන නුගගහමුලවත්තද, පුවක්ගහකොටුවහේන යන නොම්මර 13තේ බිම්කට්ටියේද, පුවක්ගහකොටුවවත්ත යන නොම්මර 12තේ බිම්කට්ටියේ සහ පුවක්ගහකොටුවහේන යන නොම්මර 10තේ බිම්කට්ටියේ මායිමද.

ලංකාමැනිමේ මුල් සිතියමේ නො. 714.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 14 | පුවක්ගහකොටුවහේන (ගම්සහාපාරට ඉතුරුකර තිබෙන බිම) .. | 0 | 1 | 9 |

කුරුණෑගල නි. නි. 33—1936.

---

1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,245 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1936ක්වූ පෙබරවාරි මස 21වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1936ක්වූ පෙබරවාරි මස 8වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

එච්. සී. කොක්ස්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුලත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරනු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

උපලේඛනය.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ අන්ගොමුකෝරළේ ගල්දූනුපිටිය යන ගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම්:—

උතුරට: ගොන්නාව යන ගම ගම්ඉමද.

නැගෙණහිරට : දෙල්අත්තෙඅගාරේ යන ගමේ ගම්ඉමද, දෙල්අත්තෙඅගාරේ යන ගමේ ගම්ඉමද (කිතලාවට යන පාරෙන් කොටසක්), කොන්නාව යන ගමේ ගම්ඉමද.

දකුණට සහ බස්නාහිරට : ගොන්නාව යන ගමේ ගම්ඉමද.

ලංකාමැනීමේ මුල් සිතියම නො. 2,428.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 8 | යලගොඩලේවත්ත | 1 2 25 |
| 11 | එම | 0 1 5 |
| 27 | කැටකෑලගහමූලවත්ත | 2 1 31 |
| 29 | දෙහිගහමූලවත්ත | 5 0 13 |
| 33 | කොස්ගහමූලවත්ත | 0 3 25 |
| 35 | දන්ගහමූලවත්ත | 0 1 3 |
| 36 | එම | 0 2 26 |
| 39 | කැටකෑලගහමූලවත්ත | 1 1 9 |
| 40 | හෙළඹගහමූලවත්ත | 0 3 28 |
| 45 | කෝන්ගහමූලවත්ත (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 0 14 |
| 48 | කෝන්ගහමූලවත්ත | 1 0 3 |
| 49 | එම (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 0 10 |
| 50 | ගලගාවවත්ත | 1 1 37 |
| 56 | කොහොඹගහමූලවත්ත | 1 1 9 |
| 58 | එම | 1 1 23 |
| 61 | ගොරක්ගහමූලවත්ත | 0 3 35 |
| 62 | කහටගහමූලවත්ත | 3 1 29 |
| 65 | කැරව්ගහමූලවත්ත | 1 3 36 |
| 66 | කලබටුවාවේවත්ත | 0 3 24 |
| 67 | එම | 0 0 25 |
| 69 | තල්ගහමූලවත්ත | 1 2 25 |
| 70 | එම | 1 3 20 |
| 71 | එම (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 0 7 |
| 72 | තෙලඹගහමූලවත්ත | 1 2 35 |
| 73 | එම | 0 3 22 |
| 81 | දන්පිල්ලෑවේවත්ත | 3 2 2 |
| 82 | කහටගහමූලවත්ත | 1 1 19 |
| | මුළුගනන | 37 1 20 |

කුරුණෑගල කි. නි. 34—1936.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 10,704, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අප්‍රේල් මස 3වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට වහකෝට්ටේ කුඹාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුකරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කේ උතුරු මාතලේ කෝරළයේ උඩුගොඩ උඩසිය පත්තුවේ කොරළයේ පිහිටා තිබෙන බිම් කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියම නො. 54. ගම—කොහොලන්වෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 11 | මාරගහමූලහේන | මොහොට්ටාලගෙදර ඩිංගිරිඅම්මා, (2) එම අගෝමැනිකා, (3) එම බන්ඩාර මැනිකා, (4) එම අනුලාකුමාරිහාමි, (5) පහල වලව්වේ කපිලරත්න, (6) එම විමලා කුමාරිහාමි, (7) එම කුමාරිහාමි, (8) එම අගෝමැනිකා, (9) එම පුන්චිබන්ඩා, (10) මොහොට්ටාලයේගෙදර ලොකුමැනිකා, (11) එම විජේ රත්න බන්ඩා, (12) එම දිසාබන්ඩා, (13) සෙනෙවිරත්න බන්ඩා, (14) එම හීන්බන්ඩා, (15) එම කරුණාරත්න, (16) කොහොලන්වල පදිංචි ඇම්. මද්දුමබන්ඩා | හේන | 0 1 14 |
| 19 | එම | එම | එම | 0 3 14 |
| 24 | කොලොන් ගහමූල හේන | එම | එම | 1 3 19 |
| 45 | ඇල්හේන්කනත් තේවත්ත | එම | එම | 0 1 30 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බදුකරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ පෙබවාරි මස 15වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පොල්ගහවිල නහනම් මූකලානට යෑමට පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

ඇf්ජ්. වී. පී. සිතියමේ නො. 605 (1). ගම—ඒරමුල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 165 | වැලිපතකුඹුර | ඔවිට | ගාල්ලේ පදිංචි මිසිස් ඩී. සී. ඇම්. ජයවර්ධන | 0 0 3 |
| 166 | එම | ඔවිට, වයස අවුරුදු 3ගේ (මැරිච්ච) පොල්ගස් 1යි | එම ඒරමුල්ලේ පදිංචි පෝද්දිවල මාරගේ කුරුන්හාමි වැලිල්ලට අයිතිකම්කියන් | 0 0 2·3 |
| 167 | හල්ගහදෙලදූව | ඉඩමේ, වයස අවුරුදු 3ගේ පොල්පැල 11ක් සහ තාව කාලික කටුසරබෝග | ඒරමුල්ලේ පදිංචි පෝද්දිවලමාරගේ කුරුන්හාමි | 0 0 15 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහෑකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වල අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ මාර්තු මස 16වෙනි දින පෙරවරු 10ගේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 17වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පල්ලිකුඩාව යන ග්‍රාමයට අළුත් පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 355. ගම—මරක්කලගොඩ.

| නො. | ඉඩමේ නම. | අඥම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බොරළුහේන | හේන, අඩිපාරක කොටසක් තිබේ | සයිබූඩෝරේ මොහමඩ් කාසිම්, තංගල්ල | 0 0 11·1 |
| 2 | එම | මුඩුබිම, අඩිපාරක කොටසක් තිබේ | එම | 0 0 7·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ මාර්තු මස 16වෙනි දින පෙරවරු 9යේ කතිසමට තංගල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 15වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—සිටිනාමළුවේ ස්වභාෂා පාඨශාලාවේ ප්‍රයෝජනය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අතුරු සිතියම 4. සිතියම නො. 312. ගම—සිටිනාමළුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 298 | කපුගමගෙදරවත්ත, ලොකු අප්පුගේවත්ත | මුඩුබිම්, පොල්ගස් 2ක් අවුරුදු 60ක්වූද, පොල්පැල 2ක් අවුරුදු 1ක්වූද, අඹගස් 1ක් අවුරුදු 2ක්වූද, මුරුංගාගස් 3ක් අවුරුදු 3ක්වූද, ස්කෝලයක් සහ කකුස්සක්ද (ස්ථිර ගොඩනැගිලි පොල්අතු සෙයනලද සහ ස්කෝලයට යන පාර සහිත ඉඩම් | ඩී. ඩබ්ලිව්. චාර්ලිස් සිල්වා | 0 | 1 | 36·2 |
| 299 | ලොකුඅප්පුගේවත්ත, නොහොත් තුනගහවත්ත | අවුරුදු 50ක් පමණ ඇති පොල්ගස් 1ක් සහ වඩිච්චි පොල්අතු සෙයනලද ගෙයක් තිබෙන ඉඩම | ඩී. ඩබ්ලිව්. චාර්ලිස් සිල්වා සහ අංගීසිංලියනආරච්චි ගෙයි බාලහාමි | 0 | 0 | 5 |
| 300 | ලොකුඅප්පුගේවත්ත .. | පොල්අතු සෙයනලද ගෙයක් තිබෙන වත්ත, පැපොල්ගස් 2ක් අවුරුදු 2ක්වූ සහ කෙසෙල් ගස් 1ක් ඇති වත්ත | ඩී. ඩබ්ලිව්. චාර්ල් සිල්වා සහ පලවින්නගේ අරදියස් මුත්තුකුමාරන | 0 | 0 | 5 6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ අප්‍රේල් මස 1වෙනි දින පස්වරු 1යේ කතිසමට තංගල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 17වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්තවම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—සූරුවිල වැව විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ. ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 283. ගම—පහල මයියාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | අඹගහගාල .. | දුම්ගාල .. | (1) පහල මයියාවේ සමරප්පුලිලෙආරච්චිගේ හෙන්ද්‍රික් සිංඤෝ, (2) එම ගම එසේම මුදලිහාමි, (3) එම ගම එසේම සිංඤෝ අප්පුහාමි | 0 | 0 | 38·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ මාර්තු මස 26වෙනි දින පස්වරු 2.30 කතිසමට හලාවත කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 18වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඒ. ඊ. ක්‍රිස්ටෝෆල්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශකරන්නේනම් වයඹ දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1936ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර මගුල්මඩුවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණී සිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඒ. රොඩ්රීගෝ,
පිස්කල් වම්හ.

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 15වෙනි දින
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

## පාරක් වැසීම.

කොළොන්නාවේ තෙල් ආගාරය හරහ තිබෙන පුද්ගලික පාර වර්ෂ 1936ක්වූ මාර්තු මස 1වෙනි දින සියළු රථ පදික ගමනාගමනය සඳහා වසාදමනු ලැබේ

ජී. ඇස්. වුඩ්වින්,
වරාය පිළිබඳ සභාවේ සභාපතිතැන.

කොළඹ, පෙබරවාරි 12, 1936.

---

## අන්‍ය දැන්වීම.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නිල්දන්ඩාහින්නේ පදිංචි බමුණු සිංහගේ දොන් මෝරිස් සමරසේකර වන මම කෑගල්ල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් ඔප්පු තිරප්පු ආදියේ කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්සෙනෙකු හැටියට පත්කරණු ලබන පිණිස මෙදින සිට තුන්මාසයක් ගතවූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කරණ බව වර්ෂ 1907යේ 1වෙනි ආඥා පණතේ 1B ෂැඩ්යුල් පත්‍රයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙසින් දැනුම්දී සිටිමි.

බී. ඩී. මෝරිස් සමරසේකර

වර්ෂ 1936ක්වූ පෙබරවාරි මස 5වෙනි දින
නිල්දන්ඩාහින්නේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.